# සාරා දැන් හොඳ ළමයෙක්!!



මින්සදි ශෂ්මිලා දිසානායක

# සාරා දැන් හොඳ ළමයෙක් !!!!

මින්සදි ශෂ්මිලා දිසානායක

ප්‍රථම මුද්‍රණය : 2025

කතෘ : මින්සදි ශෂ්මිලා දිසානායක.

ලිපිනය : නො; 212/1,පොල්ගහඅංග,වැලිගල්ල.

ISBN අංකය : ISBN 978-624-208-316-2

# පිදුම

***නිසි දැනුමෙන් පෝෂණය කරන්නට වෙර***
***දරන,මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,***

***පන්තිභාර ගුරුතුමිය ,ඇතුළු ගුරු  මාපියවරුන්ට,***

***මා පෝෂණය කරන,ඇති දැඩි කරන මාගේමවිනි,***
***පියාණෙනි ඔබදෙපළටත්,***

***මා වැනිම දැනුම හඹා යන මාගේ සොයුරු කැලටත්,***

***මේ පොත ආදරයෙන් පුද කරමි.***

***********

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධාවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරුන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසැල් ප්‍රජාවම ආදි කතෘ කරන ලද **අත්ථදස්සි මාහිමිපාණන්** වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී "** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,<br>
ශශිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විදුහල - මහනුවර.

සාරා කියන්නේ ලස්සනම ලසස්න පුංචි දරුවෙක්.

මෙයා ජීවත් වුණේ නුවරක . සාරා ලස්සන වුනාට එයා ළඟ තිබුනේ නපුරු ගති ගුණ. ලස්සන රූපයක් තිබුණට සාරා  හැමෝටම නපුරු  උනා. එයාගේ අම්මා  හරිම අහිංසකයි.



සල්ලි තිබුන නිසා මෙයා හරිම  ආඩම්බරයි. කාටවත් එයාගේ සෙල්ලම් බඩු අල්ලන්න දෙන්නේ නැහැ. සාරාගේ තාත්තා රට ගිහින් මෙයාට ලස්සන වටිනා පොතක් ගෙනත් දුන්නා . මේකට මෙයා හරිම ආසයි. සාරා මේ පොතට ගොඩක් කැමති නිසා, එයා හැමවෙලේම තාත්තාට කිව්වා.



"තාත්තේ ........ තාත්තේ ........ මම කවදාවත්



මේ පොත කාටවත්ම අල්ලන්න දෙන්නේ නැහැ," කියලා.

තාත්තා කිව්වා, " පුතේ එහෙම කරන්න එපා. හැමෝටම මේ පොත බලන්න, අල්ලන්න, දෙන්න .ඔයා හොඳ ගතිගුණ තියෙන හොඳ දරුවෙක් වෙන්න ඕනේ"කියලා .

"බැහැ මං මේ පොත කාටවත් අල්ලන්න දෙන්නෙ නැහැ. මගේ හොඳම යාළුවටවත් මම මේක දෙන්නේ නැහැ. මොකද මගේ යාළුවෝ මේකෙ පිටු ඉරලා කිලිටු කරයි. ඒක නිසා මම මේක කාටවත්ම දෙන්නේ නැහැ කියලා.

මෙහෙම ටික කාලයක් එයාගේ පොත ළඟින් තියාගෙන හිටියා.

එයාගේ පන්තිභාර ගුරුතුමිය පන්තියේ සෑම ළමයෙකුටම කිව්වා, එයාලා ළඟ තියෙන ලස්සන පිටු ඇති ලස්සන පොතක් අරගෙන, පසුවදා පාසලට පැමිණෙන්න කියා. ගුරුතුමිය එහෙම කිව්වේ එයාලාට දින පොතක් ලියන්න පුරුදු කරන්න ඕනේ නිසා.



සාරාට පුදුම සතුටක් ඇති වුනේ, මොකද? සාරා ළඟ ලස්සන පොතක් තියෙන නිසා.

මෙයා ගොඩාක් සතුටින් පාසල් ඇරිලා ගෙදර ගිහින් එයාගේ අර ලස්සන පොත රාක්කයෙන් අරගෙන පොත් බෑගයට දමා ගත්තා.

පන්තියට පැමිණි ගුරුතුමියපන්තියේ සිටින සෑම දරුවෙකුටම පැවසුවා.

" හැමෝටම ඊයේ මම කියපු පණිවිඩේ අහලා ලස්සන පොතක් අද ගෙනාවද" කියලා.

හැම දරුවෙක්ම හයියෙන් කෑ ගහලා" ඔව්..... ඔව්....... මම ලස්සන පොතක් ගෙනාවා" කියලා සතුටින් කෑ ගසන්න ගත්තා.

සාරත් ඉතා ආසාවෙන් එයා ළඟ තිබුණු අර ලස්සන පොත එළියට ගත්තා.

සාරත් එයාගේ පොත එළියට අරගෙන එකපාරටම හයියෙන් කෑ ගහන්න ගත්තා . "අයියෝ............" කියලා.

සාරා කෑගහන සද්දේ ඇහිච්ච සාරාගේ හොඳම යහළුවා වුනු විශ්මි සාරා දිහා බලලා.
"ඇයි ..... මොකද වුනේ? ඇයි ඔයා හයියෙන් කෑ ගහන්නේ" කියලා ඇසුවා.

සාරා එක පාරටම විස්මි දිහා බලලා සැරේන්

" ඇයි....... ඔයා මගේ පොත හිල් කරේ, මේ පොත දැන් කැත කැතවෙලා . මුළු පොතේම හැම තැනම හිල් කරලා. ඇයි....... ඔයා මගේ පොත කැත කරේ"කියලා කෑ ගැසුවා.

එක පාරටම විස්මි "නෑ...... සාරා මම කිසිම දෙයක් කරේ නැහැ. මම කිසිම දෙයක් දන්නේ නැහැ" කියලා.

ඒ උනාට සාරා විශ්මි කියන දේ පොඩ්ඩක්වත් අහන්නේ නැතුව දිගටම අඬන්න පටන් ගත්තා. මේ දෙන්නගේ දබරය ඇහිච්ච පන්තියේ ගුරුතුමිය,

"ඇයි ......... ඔය දෙන්නා අඬන්නේ, ඇයි .... ඔය දෙන්නා ඔය හයියෙන් ම කෑගගහා රණ්ඩු වෙන්නේ" කියලා ඇසුවා.



"විශ්මි මගේ පොත ඉරලා" කියලා සාරා හයියෙන් අඬන්න පටන් ගත්තා.

ඒ එක්කම පන්තිභාර ගුරුතුමිය සාරයි, විශ්මී ළඟට ගිහින් මේ වෙලා තියෙන කරදරේ මොකක්ද? කියලා බැලුවා. එතකොට පන්තිභාර ගුරුතුමිය දැක්කා සාරා ළඟ තියෙන පොත.



පන්තිභාර ගුරුතුමිය ඇහුවා "ඇයි..... දැන් ඔය ලස්සන පොතක් තියෙද්දි සාරා අඬන්නෙ" කියලා.

සාරා තමන් ළඟ තියෙන පොත ගුරුතුමියට දීලා " බලන්න ටීචර් ....... විශ්මි මගේ ලස්සන පොත හිල් කරලා " කියලා.

ගුරුතුමිය පොත අතට අරගෙන හොඳින් පරීක්ෂා කර බැලුවා. ගුරුතුමියට තේරුණා වෙලා තියෙන දෙය. ගුරුතුමියට හිනා ගියා .ගුරුතුමිය යාළුවෝ දෙදෙනා දෙපැත්තට අරගෙන කිව්වා.



"මේක විශ්මි නෙවෙයි කරලා  තියෙන්නේ. අනික මේක මෙහෙම හිල් කරන්න විශ්මිට බැහැ.

මේක කරල තියෙන්නේ වෙන කෙනෙක්" කියලා.

"විශ්මි..... නෙවෙයි නම් කවුද? මේක මෙහෙම හිල් කරේ"  සාරා පුදුමෙන් ඇහුවා .

"මේක.... හිල් කරලා තියෙන්නේ ඔයාලාගේ ගෙදර ඉන්න පුංචිම පුංචි, චූටිම චුට්ටි දඟකාර මී පැටියෙක්"කියල ගුරුතුමී කිවුවා.

එතකොටම, සාරා පුදුමෙන් වගේ පොත දිහා බැලුවා. බලනකොටම සාරාට මතක් උනා ගෙදර මීයෝ පිරිලා ඉන්නවා නේද? .. කියලා.



සාරාට ලැජ්ජා හිතුනා මොකද? එයාගේ හොඳම යාළුවාටනේ එයා බැන වැදුනේ ඒක නිසා.

එයා විශ්මි ළඟට ගිහින් මට සමාවෙන්න විශ්මි කියලා ලැජ්ජාවෙන් පැවසුවා.

විශ්මිත් එයාට සමාව දීලා නැවත සාරා සමග යහළු වුණා.



සාරා හොඳ ළමයෙක් වෙන්න,කියා ගුරුතුමිය සාරාට උපදෙස් දුන්නා.

එදා ඒ සිදුවීමෙන් පසුව සාරා හිතට ගත්තා ආයේ කවදාවකවත් කිසිම යහළුවෙකුට නපුරු වෙන්නේ නැහැ.

ආයේ මම කාටවත්ම කෑ ගහන්නේ නැහැ.

හැමෝටම ආදරයෙන් කරුණාවෙන් සලකනවා කියලා.

ඒ වගේම සාරා හිතට ගත්තා මම මොනම ප්‍රශ්නෙකදිවත් කලබල නොවී, වෙලා තියෙන දේ හොඳට හොයලා බලලා ප්‍රශ්නවලට විසඳුම් නුවණක්කාරව සිතා පිළිතුරු සොයා ගන්නවා කියලා.

ඉතින්….. එදා ඉඳන් සාරා හොඳ ළමයෙක් වුණා !!!!!

... නිමි...



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර් මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර් යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත් , ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන් ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරිමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර් ථකාරී මෙන්ම සමාජය තුළ සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර් මාණය වීමට හේතු වී ඇති බව පර් යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර් මාණ ජාත්‍යන්තර පාඨකයින් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර් මාණ හැකියාව තුළින් එයට පිවිසී පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිමර්ාතෘ සම්බන්ධීකාරක ,
සෙනවිරත්න මහලේකම්